## ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් - 2016/2017

---

ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියුතු වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය හා සීමා කිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන පරිදි, සමාගම විසින් ක්‍රමවත්ව ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති රීති හා රෙගුලාසිවලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/ 2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 21 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන දීමනා වශයෙන් රු.3,180,000 ක් ගෙවා තිබුණි. |
| (ii) 3.3 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව නිල වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන දීමනා ලෙස රු.480,000 ක් ගෙවා තිබුණි. |
| (iii) 3.1 සහ 3.2 වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ වෙත ඔවුන්ගේ මාසික ඉන්ධන සීමාවන් ඉක්මවා රු.728,588 ක ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කර තිබූ අතර ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 39,988,886 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 26,677,844 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,311,042 ක එනම් සියයට 49 ක වර්ධනයක් විය. බෙදාහැරීමේ හා පරිපාලන වියදම පිළිවෙලින් රු. 23,902,194 කින් හා රු. 79,337,980 කින් වැඩිවුවද දළ ආදායම හා පොලී ආදායම පිළිවෙලින් රු. 98,370,707 කින් හා රු. 21,172,322 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 මූල්‍ය වර්ෂයේ රු. 66,940,292 ක් ව පැවති සමාගමේ බදු පසු ශුද්ධ ලාභය 2013/2014 සහ 2014/2015 මූල්‍ය වර්ෂ දෙක තුළ ක්‍රමයෙන් අඩු වී ඇති අතර 2015/2016 මූල්‍ය වර්ෂයේ සිට නැවත ක්‍රමයෙන් වර්ධනය වී 2016/2017 මූල්‍ය වර්ෂයේ දී රු. 39,988,886 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012/2013 මූල්‍ය වර්ෂයේ රු. 309,547,112 ක් ව පැවති සමාගමේ දායකත්වය 2016/2017 මූල්‍ය වර්ෂයේ දී උච්චාවචනයන් සහිතව රු. 419,451,510 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

සංයුක්ත සැලැස්මේ සඳහන් පරිදි සමාගම විසින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු පහත පරිදි වේ.

- විවිධත්වයෙන් යුතු භාණ්ඩ විකුණුම්කරණය හා එමගින් වෙළඳපල තුළ ස්ථාවර වීම.
- ජාත්‍යන්තර වෙළඳපොලෙහි ඇති කීර්තිමත් සහ විශ්වාසදායී වෙළඳ නාමයන් අප රට තුළ නියෝජනය කිරීම.
- ආයතනයේ ආදායම හා ලාභය වර්ධනය කර එමගින් ආයතනයේ නාමය ප්‍රචලිත කිරීම.
- රාජ්‍ය අංශයේ අවශ්‍යතා කාර්යක්ෂම අයුරින් ඉටු කිරීම මගින් සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම.
- පාරිභෝගික අවශ්‍යතා ඉටුකරලීම සඳහා ආයතනයේ ප්‍රධාන නිෂ්පාදන ආයෝජන ක්ෂේත්‍ර මගින් කටයුතු දියත් කිරීම.
- රාජ්‍ය පාරිභෝගිකයන් හා සේවක මණ්ඩලය පිළිබඳව නිරන්තර අවධානය යොමු කරමින් ඵලදායීතාවය වර්ධනය කිරීමට කටයුතු කිරීම.

විකුණුම් ආදායම වැඩි කිරීම තුළින් ලාභය වැඩි කර ගැනීම සමාගමේ අරමුණක් වූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 27 කින් වැඩි කර ගැනීමට සමාගම සමත් වී තිබුණි.

### 4.2 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සමාගමේ සම්පත්

------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් දහ දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර, සමාලෝචිත වර්ෂයේදී එම කාර්ය මණ්ඩලය සඳහා රු.2,157,700 ක වැටුප් හා දීමනා සමාගම විසින් ගෙවා තිබුණි.

## 4.3 නොවිසඳී ඇති විගණන ඡේද

සමාගමට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් අඩුපාඩු සම්බන්ධයෙන් සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| (අ) 2015/16 | 2.2.1 (ඇ) | කොන්ත්‍රාත් සමාගමක් වෙත සපයන ලද වායුසමීකරණ යන්ත්‍ර වෙනුවෙන් අයවිය යුතු රු.1,756,220 ක් අයකර නොගැනීම. |
| (ආ) 2015/16 | 4.3 (ආ) | අලෙවි කිරීමේ හැකියාව හඳුනා ගැනීමකින් තොරව මිලදී ගන්නා ලද රු.75,171,712 ක් වටිනා ජංගම ගබඩා (කොකූන්) 35 ක් ගබඩා කර තබා ගැනීම. |

## 4.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

සමාගම විසින් අලෙවිසැලක් සහ කාර්යාලයක් පිහිටුවීම සඳහා 2013 නොවැම්බර් 01 දින සිට මාසිකව රු.565,000 බැගින් ගෙවීමට කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනීම හා එහි නවීකරණ කටයුතු සඳහා රු.16,281,285 ක් වැය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

(ආ) ගොඩනැගිල්ල කුලියට ලබාගැනීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ තිබුණද එය විධිමත් පරිදි සකස්කර නොතිබුණු අතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) 2013 නොවැම්බර් මාසයේ කුලියට ලබා ගන්නා ලද ගොඩනැගිල්ල 2015 නොවැම්බර් මාසය වන තෙක් භාවිතයට ගෙන නොතිබූ අතර එම කාලසීමාව වෙනුවෙන් කුලී වශයෙන් රු.13,329,000 ක් වැය කර තිබුණි. පසුව ගොඩනැගිලි හිමිකරු සමග ඇතිවූ නොඑකගතාවයන් හේතුවෙන් ගොඩනැගිල්ලෙන් ඉවත්වීමට තීරණය කිරීම හේතුවෙන් ගොඩනැගිල්ලෙහි තිබූ වටිනාකම රු. 2,128,790 ක් වූ ස්ථාවර වත්කම් හා අලෙවි නොවූ භාණ්ඩ තොගය විධිමත් අනුමැතියකින් හා පූර්ව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව එම වටිනාකමට වඩා රු. 1,128,790 ක් අඩුවෙන් එනම් රු. 1,000,000 කට 2016 ජූනි 16 දින වෙන්දේසියේ අලෙවි කර තිබුණි.

(ඈ) 2013 නොවැම්බර් සිට වසර 10 ක් වෙනුවෙන් කුලී පදනම මත ලබාගත් මෙම ගොඩනැගිල්ල අදාල අරමුණ වෙනුවෙන් යොදවා නොතිබීම හේතුවෙන් 2016 අගෝස්තු මාසයේදී එනම්, වසර 03 කින් ඉවත්වීමට සිදුවී තිබුණි. එම නිසා එහි නවීකරණ කටයුතු වෙනුවෙන් දරන ලද රු.16,281,285 ක මුදලින් රු.10,636,782 ක් ලාභයට එරෙහිව කපාහැර තිබුණද එම මුදල සමාගමට මූල්‍යමය පාඩුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 මාර්තු 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 329 දෙනෙකු හා තත්‍ය කාර්ය මණ්ඩලය 425 දෙනෙකු වූයෙන් කාර්ය මණ්ඩල අතිරික්තය 106 දෙනෙකු හා ඌනතාවය 10 දෙනෙකු විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව සමාගමේ කාර්ය මණ්ඩලයට අදාලව බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගෙන නොතිබූ අතර විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් / සේවකයන් 106 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ආ) ඉහළ සහ මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 10 ක් පුරප්පාඩුව පැවතීම තීරණ ගැනීම හා කටයුතු අධීක්ෂණය කිරීම කෙරෙහි බලපා තිබූ අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද කටයුතු කර නොතිබුණි.

## 5 . ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 සමාගම පිහිටුවීම

---

මෙම සමාගම 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාවක් ලෙස පිහිටුවා ඇති අතර පසුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලංකා ජෙනරල් ට්‍රේඩින් කම්පනි ලිමිටඩ් යන නමින් ද 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩිං (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් යන නමින් ද සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණි.

### 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර තිබුණේ පිළිවෙලින් 2017 සැප්තැම්බර් 14 හා 2018 අප්‍රේල් 27 යන දිනවල දීය.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම |
| (ආ) | තොග පාලනය | තොග හා තොග වාර්තා පවත්වා ගැනීමේ දුර්වලතා පැවතීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | දීර්ඝකාලීන ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | මෙහෙයුම් හා මූල්‍ය පාලනය | (i) අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකිරීම.<br>(ii) පවත්නා කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන නොවීම.<br>(iii) මුදල් අතිරික්තය ස්ථාවර තැන්පතුවල යෙදවීම සහ මූල්‍ය අවශ්‍යතා සඳහා කෙටිකාලීන ණය ලබාගැනීම. |